අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை - 2026
General Certificate of Education (Ord. Level) Examination - 2026

ඉතිහාසය
History - வரலாறு

උපකාරක තක්සේරුව - පිළිතුරු පත්‍රය
உதவி மதிப்பீடு - விடைப்பத்திரம
Supportive Assessment Answer sheet



Answer Paper – I ,II පිළිතුරු පත්‍රය – I,II (සිංහල මාධ්‍යය)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
අ.පොස. (සා.පෙළ) විභාගය 2026
33 ඉතිහාසය - උපකාරක තක්සේරුව

II පත්‍රය -

I කොටස

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

(අ) කොටස - ලකුණු 18
(ආ) කොටස - ලකුණු 12
} ලකුණු 30

II කොටස

ප්‍රශ්න අංක 2 - ලකුණු18
ප්‍රශ්න අංක 3 - ලකුණු18
ප්‍රශ්න අංක 4 - ලකුණු18
ප්‍රශ්න අංක 5 - ලකුණු18
ප්‍රශ්න අංක 6 - ලකුණු18
ප්‍රශ්න අංක 7 - ලකුණු18
} (ඕනෑම ප්‍රශ්න 4 කට)
4 × ලකුණු18 = ලකුණු 72

III කොටස

ප්‍රශ්න අංක 8 - ලකුණු18
ප්‍රශ්න අංක 9 - ලකුණු18
} (ඕනෑම ප්‍රශ්න 1 කට)
1 x 18 ලකුණු =18


ලකුණු 120

I පත්‍රය - පිළිතුරු


ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
01	3	11	2	21	2	31	4
02	2	12	1	22	3	32	2
03	4	13	2	23	3	33	3
04	1	14	1	24	1	34	1
05	3	15	3	25	1	35	2
06	2	16	4	26	2	36	4
07	3	17	4	27	1	37	1
08	1	18	3	28	3	38	2
09	2	19	2	29	4	39	1
10	4	20	4	30	3	40	3

II කොටස

1. (අ) (i)



1. (අ) (ii)



(ආ) (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ඇළ මාර්ග ඉදි කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ පුද්ගලයන් සෙල්ලිපිවල හැඳුන්වා ඇති නම කුමක් ද?

B - අදිකාරම්වරුන්ගේ ආඥා හා පණිවිඩ ප්‍රාදේශිය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස හැඳින් වූයේ කවර නමකින් ද?

C - ව්‍යවස්ථාදායක සභාවට මුල්වරට තේරී පත් වූ උගත් ලාංකික මන්ත්‍රීවරයා නම් කරන්න.

D - ඇමෙරිකා ඒක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා කවුරුන් ද? (ලකුණු 04 යි)

(ආ) (i). A - අඩික
B - කටුපුල්ලේ
C - පොන්නම්බලම් රාමනාදන්
D - ජෝර්ජ් වොෂිංටන්

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2. මෙම නිර්මාණ ඉදිකර ඇත්තේ කුමන ඔය හරහා ද?

3. මෙම නිර්මාණය දැකි හැකි ඓතිහාසික නගරය නම් කරන්න.

4. මෙම නිර්මාණයෙන් පිළිඹිඹු වන තාක්ෂණික ක්ෂේත්‍රය කුමක් ද?



A

(ලකුණු 04 යි)

1. ගල් පාලම
2. මල්වතු ඔය
3. අනුරාධපුරය
4. පාලම් තැනිමේ තාක්ෂණය (ලකුණු 04 යි)

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

2. ඔහු පාලකයා ලෙස කටයුතු කළ රට කුමක් ද?

3. ඔහුගේ අත්සනින් ලංකාවට එවන ලද ප්‍රසිද්ධ ලිපිය හැඳින් වූ නම කුමක් ද?

4. එම ලිපිය එවන විට ලංකාවේ සිටි ලන්දේසි ආණ්ඩුකාරවරයා කවුරුන් ද?



(iii). B

1. පස්වන විලියම්
2. ඕලන්දය
3. කිව් ලිපිය
4. ෆන් එංගල්බෙක් (ලකුණු 04 යි)

II කොටස

ප්‍රශ්න අංකය 02

2. (i) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වන දකුණු ඉන්දීය මූලාශ්‍රය ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ශිලා ලිපි නිර්මාණය කර ඇති ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයවල ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුරාවස්තු රැකගැනීමේ වැදගත්කම නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

02. (i)

- සිලප්පදිකාරම්
- මණිමේකලෙ
- පදිර්රුප්පත්තු (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

- ලෙන් ලිපි
- ගිරි ලිපි
- ටැම් ලිපි
- පුවරු ලිපි
- ආසන ලිපි (ලකුණු 1 x 4 = 04 යි)

(iii)

- ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස් කර ගැනීමට
- එක් එක් අවධිවල දේශපාලන ආර්ථික සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට
- එක් මූලාශ්‍රයක් මගින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනීමට
- රටක විදේශීය සබඳතා අධ්‍යයනය කිරීමට (ලකුණු 2 +3 = 5 යි)

(iv)

- ජාතික අනන්‍යතාවය තහවුරු කර ගැනීමට
- අනාගත පරපුරට දායාද කිරීමට
- සංචාර කර්මාන්තයේ වර්ධනයට (ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 03

3. (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ශිලා මෙවලම් යොදා ගෙන සිදු කළ කාර්යයන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසස්ථාන තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ සාධක දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පුර්ව ඓතිහාසික යුගයේ දැකගත හැකි සුසාන විධි දෙකක් නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

03. (i)

- සතුන් දඩයම් කිරීම
- කැපීම්
- සිරීම්
- තැළීම්
- හැරීම් (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

- ආහාර සපයා ගැනීමේ පහසු ප්‍රදේශ
- ජලය පහසුවෙන් ලබා ගත හැකි තැන්
- ගල් මෙවලම් තනා ගැනීමට අවශ්‍ය කරන පාෂාණ වර්ග බහුල ප්‍රදේශ (ලකුණු 2 x 2 = 04 යි)

(iii)

- ශිලා මංජුසා සුසාන
- හරණී සුසාන
- මැටි ඔරු සුසාන (ලකුණු 2 +3 = 5 යි)

(iv)

- පසේ ස්වභාවය
- භූ විෂමතා
- වාර්ෂික වර්ෂාපතනය
- ජල වහනය
- ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය (ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 04

4 . (i) අතීතයේ මෙරට රෝහල් ඉදි කිරීමට කටයුතු කළ රජවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීත ජනයා හේනක් සකස් කර ගැනීමේ දී අනුගමනය කළ පියවර දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) මෙරට පැරණි සමාජයේ නීතිය හා සම්ප්‍රධාය ක්‍රියාත්මක වූ ආකාරය පහත සඳහන් ක්ෂේත්‍ර දෙක ඔස්සේ උදාහරණ එක බැගින් දක්වමින් විස්තර කරන්න.

A - වෙළෙඳාම
B - පරිසරය (ලකුණු 05 යි)

(iv) පැරණි ජන සමාජයේ කාන්තාවට ගෞරවනීය ස්ථානයක් හිමි වූ බව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4 (i)

- පළමුවන උපතිස්ස රජු
- හතරවන කාශ්‍යප රජු
- දුටුගැමුණු රජු
- බුද්ධදාස රජු
- පණ්ඩුකාභය රජු (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

- ධාන්‍ය හා එළවළු වවා ගැනීමට ප්‍රමාණවත් තරමේ ඉඩමක් මහ කැලෑවෙන් තෝරා ගැනීම
- කුඩා ගස් කපා දමා එළි පෙහෙළි කර ගැනීම
- ගිනි තැබීමට පෙර සියලු සතුන්ට ඉන් ඉවත් වන ලෙස ශබ්ද නඟා කෑ ගැසීම
- හේන වටා දඬුවැටක් ඉදි කිරීම (ලකුණු 2 x 2 = 04 යි)

(iii) A - වෙළෙඳම
හෝපිටිගම සෙල්ලිපිය ඇසුරෙන් විමසා තිබීම

B - පරිසරය
පරිසරය හා සම්බන්ධ නීතිරීති ඇසුරෙන් විමසා තිබීම
(කොණ්ඩවට්ටවාන් ලිපිය /බුද්ධන්නේහෙළ ලිපිය /
මිහින්තලා පුවරු ලිපිය)

(ලකුණු 2 +3 = 5 යි)

(iv)

- රාජ්‍ය පාලනයට සම්බන්ධ වීම (ලීලාවතී /චුල සීවලී)
- ප්‍රදේශ පාලනයට සම්බන්ද වීම (පරුමකලු)
- මාතෘත්වය ලැබීම (විහාර මහා දේවි කතාව)
- සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවක් ලෙස (මධුපාචිකා/ අශෝක මාලා කතාව)
- දේපලවල හිමිකාරිත්වය (කොක්ඇඹේ සෙල්ලිපිය)
- රූපලාවන්‍ය පිළිබඳ උනන්දු වීම (සීගිරි චිත්‍ර , ඉබ්බන්කටුව මාලය , අඩරංචාමඩමෙන් හමු වූ යකඩ කූර හා කහ සහ රතු පැහැති ගුරු ගල්) (ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 05

5. (i) පළමු නාගරීකරණයට අයත් පාලන මධ්‍යස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමෙන් පසුව බිහි වූ පහත සඳහන් පාලන මධ්‍යස්ථානවල පාලකයන් දී ඇති වරහන තුළින් තෝරා ලියා දක්වන්න.

A - යාපහුව
B - දඹදෙණිය
C - මිණිපේ ගංදෙණිය
D - ගෝවින්ද මලය
(සංඝ සෙනෙවි, සුභ සෙනෙවි, බෝසත් විජයබාහු, බුවනෙකබාහු ආදිපාද, වන්නි විජයබාහු)

(ලකුණු 04 යි)

(iii) භයවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන සේවය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ අවධියේ ආර්ථිකය රටාවට දැකිය හැකි ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

05. (i) මාගම, අනුරාධපුරය, පොළොන්නරුව (ලකුණු 1 x 3 = 03 යි)

(ii) A - සුභ සෙනෙවි
B - වන්නි විජයබාහු
C - සංඝ සෙනෙවි
D - බුවනෙකබාහු ආදිපාද (ලකුණු 1 x 4 = 04 යි)

(iii)

- වන්නි ප්‍රදේශ ජය ගැනීම
- යාපා පටුන ජය ගැනීම
- උඩරට ජෝතිය සිටුවරයගේ කැරැල්ල මර්ධනය කිරීම
- අවසන් වරට ශ්‍රී ලංකාව ම එකසේසත් කිරීම ආදිය ඇසුරෙන් විස්තර කිරීම

(ලකුණු 2 +3 = 5 යි)

(iv)

- අහස් දියෙන් වගා කටයුතු සිදු කිරීම
- මහ වැව් ඉදි නොවීම
- අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම දියුණු වීම (අපනයන /ආනයන)
- විදේශ රටවල් සමඟ වෙළෙඳ සබඳතා ශක්තිමත් කර ගැනීම.

(ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 06

6. (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය කිරීමට පත්ව පැමිණි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ද මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍යයන් පැමිණීම නිසා මෙරට සමාජයේ සිදු වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් ශ්‍රී ලංකාවට උරුම වූ ප්‍රයෝජනවත් අංග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

06 (i)

- ෆෙඩ්රික් නෝර්ත්
- තොමස් මෙඩ්ලන්ඩ්
- රොබට් බ්‍රවුන්රිග් (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

- පොල් ගස් බද්ද ඇතුළු බදු අහෝසි කිරීම
- බදු එකතු කිරීමට නැවත දේශීය නිළධාරීන් යොදා ගැනීම
- ලන්දේසී උසාවි ක්‍රමය නැවත පිහිටු වීම
- ආදායම් එකතු කිරීමට හා අධිකරණ කටයුතුවලට වෙනම නිලධාරීන් පත් කිරීම .

(ලකුණු 2 x 2 = 04 යි)

(iii)

- මධ්‍යම පන්තියක් බිහි වීම
- කම්කරු පන්තියක් බිහි වීම
- වෘත්තිය වැඩ වර්ජන ඇති වීම
- විවිධ වෘත්තිකයන් සමාජයට එක් වීම (ලකුණු 2 +3 = 5 යි)

(iv)

- ජාත්‍යන්තර භාෂාවක් උරුම වීම
- අපනයන වැවිළි බෝග හඳුන්වා දීම
- කාර්මික විප්ලවයේ බලපෑම් මෙරටට ලැබීම
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් මෙරටට ලැබීම
- ගමනාගමන හා සන්නිවේදන කටයුතු දියුණු වීම

(ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 07

7. (i) නිදහස ලබා ගැනීමට පෙර ශ්‍රී ලංකාවේ බිහි වූ දේශපාලන පක්ෂ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව.1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව.1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ජන්ද විමසීමේ ක්‍රම දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

07. (i)

- ලංකා සමසමාජ පක්ෂය
- කොමියුනිස්ට් පක්ෂය
- බොල්ෂෙවික් ලෙනින් පක්ෂය
- ඒක්සත් ජාතික පක්ෂය (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

- ලංකාව ශ්‍රී ලංකාව ලෙස හැඳින් වීම
- බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සමග පැවති සබඳතා අවසන් කිරීම
- ශ්‍රී ලංකාව ඒකීය ජනරාජ්‍යයක් බව පිළි ගැනීම
- ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

(ලකුණු 2 x 2 = 04 යි)

(iii)

- සමානුපාතික නියෝජන ක්‍රමය
- ජනමත විචාරණය
- ජනාධිපතිවරණය ආදිය ඇසුරෙන් විස්තර කිරීම (ලකුණු 2 +3 = 5 යි)

(iv)

- රජය විසින් කර්මාන්ත සඳහා මුදල් අයෝජනය කිරීම
- කර්මාන්තවල යෙදෙන අයට පහසුකම් ලබා දීම
- මහා පරිමාණයේ කර්මාන්ත ශාලා සඳහා සහන ලබා දීම
- ආනයන ආදේශක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- අපනයන ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීම හා පෞද්ගලික අංශය දියුණු කිරීමට ක්‍රියා මාර්ග ගැනීම

(ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 08

8. (i) පුනරුදය සමයේ සිටි ගත්කතුවරු **තුන් දෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A සිට D තෙක් දක්වා ඇති පුනරුදය සමයේ නව සොයා ගැනීම් සිදු කළ පුද්ගලයින් කවුරුන්දැයි **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A - දුරදක්නය
B - ගුරුත්වාකර්ෂණ නියමය
C - රුධිර සංසරණ පද්ධතිය
D - මුද්‍රණ යන්ත්‍රය

(ලකුණු 04 යි)

(iii) පුනරුදය හේතුවෙන් ගෝලීය වශයෙන් ඇති වූ ප්‍රවණතා දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

08. (i)

- ඩාන්ටේ
- බොකැෂියෝ
- පෙට්‍රාක්
- තෝමස් මුවර්
- ෆ්‍රැන්සිස් බේකන්
- ඉරාස්මස්
- විලියම් ශේක්ස්පියර් (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

A - ගැලිලියෝ ගැලිලී
B - අයිසැක් නිව්ටන්
C - විලියම් හාවේ
D - ජෝහැන්ස් ගුටෙන්බර්ග (ලකුණු 2 x 2 = 04 යි)

(iii)

- යටත් විජිත බිහිවීම
- යුරෝපයේ චින්තනය හා සාහිත්‍ය සෙසු රටවලට ව්‍යාප්ත වීම
- යටත් විජිත තුළ යුරෝපීයන්ගේ ආගම් ව්‍යාප්ත වීම
- යුරෝපීය වාස්තු විද්‍යාව හා කලා ශිල්ප සෙසු රටවල්ට ද ව්‍යාප්ත වීම
- යුරෝපීය තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම ආදිය ලොව පුරා ව්‍යාප්ත වීම

(ලකුණු 2 +3 = 5 යි)

(iv)

- වතු වගාව ආරම්භ වීම
- නගර බිහි වීම
- ආනයන අපනයන පදනම් කරගත් ආර්ථිකයක් බිහි වීම
- මුදල් හා බැංකු කටයුතු දියුණුවට පත් වීම (ලකුණු 3 +3 = 6 යි)

ප්‍රශ්න අංකය 09

9. (i) කාර්මික විප්ලවය සමයේ ජේෂ්ඨ කර්මාන්තයේ දියුණුව සඳහා උපකාරී වූ නව නිපැයුම් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ගල් අඟුරු කැණීම් කටයුතුවලදී පතල් කාර්මිකයන් මුහුණ දුන් අභියෝග දෙකක් ලියා දක්වන. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය සමයේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය නිසා ලෝක දේශපාලනයේ ඇති වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

09. (i)

- දුවන නඩාව
- ජෙනි යන්ත්‍රය
- ජල රාමුව
- මියුල් යන්ත්‍රය
- වාෂ්ප බලටයන් ක්‍රියාත්මකවන මියුල් යන්ත්‍රය (ලකුණු 1 x 3 = 03 යි)

(ii)

- කැණීමේ දී ආකරවල එකතු වන ජලය ඉවත් කිරීම
- ගැඹුරට කැණීමේ දී ආකර පතුලේ විෂ වායු තිබීම
- ආකර පතුලේ උෂ්ණත්වය වැඩි වීම
- ආකර තුළට ආලෝකය සැපයීමේ ගැටලු (ලකුණු 2 x 2 = 04 යි)

(iii)

- රූපවාහිනිය සොයා ගැනීම
- දුරකථනය සොයා ගැනීම
- ගුවන් විදුලිය සොයා ගැනීම
- පෙනී තැපැල් සේවය ආදිය ඇසුරෙන් විස්තර කිරීම (ලකුණු 2 +3 = 5 යි)

(iv)

- ධනපති පන්තිය හා ශ්‍රමය විකුණා ජීවත් වන නිර්ධන පන්තියක් බිහි වීම
- ධනපතීන් හා කම්කරුවන් අතර ගැටුම් වෘත්තිය සංගම් බිහිවීම සේවක වැඩවර්ජන අයිතිවාසිකම් සඳහා සටන් ඇති වීම
- ලිබරල්වාදය සමාජවාදය වැනි දර්ශනවල ව්‍යාප්තිය
- නව අධිරාජ්‍යවාදය
- රාජ්‍ය නිර්බාදවාදය (ලකුණු 3 +3 = 6 යි)